# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

**නියාමක ප්‍රශ්න පත්‍රය**

# අදියර III

# 304 - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය [CPT]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

## ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය
## 304 - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය (CPT)
## නියාමක ප්‍රශ්න පත්‍රය

**අයදුම්කරුවන්ට උපදෙස් (කරුණාකර අවධානයෙන් කියවන්න) :**

**දෙනු ලබන කාලයඃ**

- කියවීම සඳහා : විනාඩි 15 යි.
- ලිවීම සඳහා : පැය 03 යි.

**ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහයඃ**

- A කොටස, B කොටස සහ C කොටස ලෙස කොටස් 3 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විතය.
- සියළුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතුය.

**ලකුණුඃ**

- එක් එක් කොටස සඳහා ලකුණු :

| කොටස | ලකුණු |
|---|---|
| A | 20 |
| B | 30 |
| C | 50 |
| **එකතුව** | **100** |

- එක් එක් ප්‍රශ්නය සඳහා ලකුණු පෙන්වා ඇත.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා සමත්වීමේ ලකුණු 50% කි.

**උත්තරඃ**

- සියළුම උත්තර,සපයනු ලබන උත්තර පොත්වල ලිවිය යුතුය. ප්‍රශ්නපත්‍රවල ලියනු ලබන උත්තර ලකුණු දීම් සඳහා ඇගයීමට ලක් නොකරනු ඇත.
- එක් එක් ප්‍රශ්නය සඳහා ඔබේ උත්තරය අළුත් පිටුවකින් ආරම්භ කරන්න.
- සියලුම පෙර වැඩ පැහැදිලිව පෙන්නුම් කළ යුතුය.
- තීරුවල උත්තර නොලිවිය යුතුය.

**උත්තර පොත්ඃ**

- එක් එක් උත්තර පොතේ මුල් පිටුවේ උපදෙස් පෙන්වා ඇත.

**ගණකයන්ත්‍රඃ**

- සංකේත වීජගණිතමය හා අවකලනය සඳහා පහසුකම් සලසා ඇති ඒවා හැර ඕනෑම ගණක යන්ත්‍රයක් අයදුම්කරුවන්ට භාවිත කිරීමට අවකාශය ඇත. වැඩසටහන් කළ හැකි ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.

**ඇමුණුම්ඃ-**

- කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව. එක් එක් ප්‍රශ්නය (වාස්තවික පරීක්ෂා ප්‍රශ්න හැර) කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ දී ඇති නිර්වචනය මත පදනම්ව අයදුම්කරුවන් විසින් උත්තර සැපයිය යුතුය.

අනිවාර්ය ප්‍රශ්න හතර (4 )කි.

(මුළු ලකුණු 20)

**A කොටස**

## *01 වන ප්‍රශ්නය*

**ග්ලෝබල් ටෙකස්** ඉන්කෝපරේෂන්, ඇමරිකා එක්සත් ජනපදයේ සංස්ථාපනය කරන ලද සමාගමකි. **සී/ස ග්ලෝබල් ටෙක්ස් ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගම** ශ්‍රී ලංකා සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද පරිපාලිත සමාගමකි. **සී/ස ග්ලෝබල් ටෙක්ස් ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගමේ** අධ්‍යක්ෂක මණ්ඩලයේ බහුතරය පත්කරනු ලබන්නේ මව් සමාගම විසිනි.

**ඔබ විසින් කළයුතු දෑ**

ශ්‍රී ලංකාවේ බදු කටයුතු සඳහා **සී/ස ග්ලෝබල් ටෙක්ස් ශ්‍රී ලංකා (පුද්ගලික) සමාගමේ** වාසිකභාවය **පැහැදිලි කරන්න.**

**(ලකුණු 05)**

## *02 වන ප්‍රශ්නය*

**සී/ස රිලීස් පොදු සමාගම** ශ්‍රී ලංකාවේ ඇති විවිධාංගීකරණය වූ විශාල සමූහයකි. එයට පරිපාලිත සමාගම් 56 ක් තිබෙන අතර ඉන් 05 ක් විදේශීය පරිපාලිතයින් වන අතර සමහර ඒවා ලැයිස්තුගත සමාගම්ය. සමූහ සමාගම් අතර භාණ්ඩ හුවමාරු කිරීමේදී විවිධ මිල ක්‍රමයන් භාවිතා කරයි. මව් සමාගම ලේකම් කටයුතු, මූල්‍ය ආදී සමහර සේවාවන් හවුල් සේවා මධ්‍යස්ථානයක් හරහා සැපයීම සිදුකරයි.

**ඔබ විසින් කළයුතු දෑ:**

**(a)** යම් ව්‍යවසායක්, වෙනත් ව්‍යවසායක ආශ්‍රිත ව්‍යවසායන් බවට පත්වීමට ඉටු විය යුතු කොන්දේසි දෙකක් (2) **සඳහන් කරන්න.** **(ලකුණු 02)**

**(b)** බදු අරමුණු සඳහා ආශ්‍රිත ව්‍යසායයන් අතර ගනුදෙනු සඳහා පිළිගත හැකි මිල ක්‍රමයන් දෙකක් (2) **සඳහන් කරන්න.** **(ලකුණු 02)**

**(c)** පැවරුම් මිල රෙගුලසි අනුව සමාගම විසින් පිළියෙල කර පවත්වාගෙන යායුතු ලියවිල්ලක් **සඳහන් කරන්න.**

**(ලකුණු 01)**

**(මුළු ලකුණු 05)**

## 03 වන ප්‍රශ්නය

ඔබ, ප්‍රවාහන පහසුකම් සැපයීමේ නිරතව සිටින සමාගමක් වන **සී/ස ස්පීඩ් කැබ්ස් (පුද්ගලික) සමාගමේ** අභිනවයෙන් පත්වූ ගණකාධිකාරීවරයාය. සමාගම රඳවාගැනීමේ බදු නියෝගවලට අනුගත වී නොමැති බව දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිළධාරීන් විසින් මෑතකදී කරන ලද ක්ෂේත්‍ර විග්‍රහයකදී අනාවරණය කරගෙන තිබේ. 2019 සැප්තැම්බර් මාසය තුළදී පහත ගෙවීම් සිදුකර තිබේ:

- කාර්යාල පරිශ්‍රය සඳහා කුළි ගෙවීම-රු.40,000/- කි.
- සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ අතුරු ලාභාංශය රු.120,000/- කි.
- සමාගමේ වාහන අළුත් වැඩියාකරන යන්ත්‍රික ශිල්පියෙකුට රු.100,000/- ක් ගෙවා තිබේ.
- බැංකුවකින් ලබාගත් වාහන මූල්‍ය කල්බද්දක් සඳහා රු 53,650/- ක පොළියක් ගෙවා තිබේ.
- සේවක නඩුවක් වෙනුවෙන් ලබා ගත් සේවා සඳහා නීතීඥයෙකුට රු30,000/- ක් ගෙවන ලදී.

**ඔබ විසින් කළයුතු දෑ:**

ඉහත ගෙවීම් ලින් රඳවා ගැනීමේ බදු අඩුකර ගැනීමකට ඇති වගකීම **සඳහන් කරන්න.**

*(ඔබ විසින් අදාලවන විටක රඳවා ගැනීමේ බද්ද ගණනය කළ යුතු අතර අදාල නොවන විටක ඊට හේතු සඳහන් කළ යුතුය.)* **(ලකුණු 05)**

## 04 වන ප්‍රශ්නය

ඔබ එකතු කළ අගය මත බද්ද (VAT) සඳහා ලියාපදංචි වූ සමාගමක් වන සී/ස ABC (පුද්ගලික) සමාගමේ බදු ගණකාධිකාරිවරයාය.

**ඔබ විසින් කළයුතු දෑ:**

**(a)** එකතු කළ අගය මත බදු පනත අනුව භාණ්ඩ සඳහා සැපයීමේ වේලාව යනු කුමක් දැයි **පැහැදිලි කරන්න.**

**(ලකුණු 03)**

**(b)** ශ්‍රී ලංකාවේ සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රමය යටතේ ආපසු ගෙවීමක් සඳහා සුදුසුකම් ලැබීමට සෑහිමට පත්විය යුතු කොන්දේසි දෙකක් **සඳහන් කරන්න.** **(ලකුණු 02)**

**A කොටසේ අවසානය**

**අනිවාර්ය ප්‍රශ්න (03) කි**

(මුළු ලකුණු 30)

**B කොටස**

## *05 වන ප්‍රශ්නය*

**සීමාසහිත රසසිරි (පුද්ගලික) සමාගම**, 2018 අප්‍රේල් 01 වන දින සංස්ථාපනය කරන ලද අතර එදිනම ව්‍යාපාර කටයුතු අරඹන ලදී. 2018/19 තක්සේරු වර්ෂය සඳහා කිසිඳු බදු ගෙවීමක් සිදුකර නොමැති අතර ආදායම් වාර්තාද තවමත් ඉදිරිපත් කර නැත.

සමාගමේ බදු උපදේශකවරයා වශයෙන් ඔබ පත්කර තිබේ.

**ඔබ විසින් කළයුතු දෑ:**

**(a)** 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීම් සිදු කළ යුතු දිනයක් **සඳහන් කරන්න.** **(ලකුණු** 03)

**(b)** 2018/19 තක්සේරු වර්ෂය සඳහා වාරික වශයෙන් ගෙවිය යුතු බද්ද ගණනය කරන්නේ කෙසේ දැයි **පැහැදිලි කරන්න.** **(ලකුණු** 04)

**(c)** ආදායම් මත වාරික නොගෙවීම මත අදාල විය හැකි දණ්ඩන ප්‍රතිපාදන **පැහැදිලි කරන්න.** **(ලකුණු** 03)

**(මුළු ලකුණු** 10)

## *06 වන ප්‍රශ්නය*

**සිම්පල් ප්ලාන්ට්ස්** යනු 2:1 අනුපාතයට ලාභ අලාභ බෙදා ගනිමින් **රුවිනී** සහ **බුවිනි** විසින් පවත්වාගෙන යනු ලබන හවුල් ව්‍යාපාරයකි. ඔවුන් පැළ තවානක් පවත්වාගෙන යයි.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශන පහත දැක්වේ.

| | රු. |
|---|---|
| පැළ විකිණීමෙන් දළ ලාභය | 9,760,000 |
| ලාභාංශ - රඳවා ගැනීමේ බදුවලින් පසු | 64,500 |
| මිතුරෙකුට දුන් ණය සඳහා පොලිය | 219,700 |
| අඩුකළා | 10,044,200 |
| බෙදා හැරීමේ වියදම් | (1534,000) |
| පරිපාලන වියදම් | (5,430,000) |
| **ශුද්ධ ලාභය** | **3,080,200** |

ඉහත ශුද්ධ ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩු කර ඇත:

හවුල්කරුවන්ගේ වැටුප් - **රුවිනි** රු.600,000/-
- **බුවිනි** රු.1,200,000/-

ප්‍රාග්ධන සඳහා පොලී - **රුවිනි** රු.25,000/-
- **බුවිනි** රු.86,000/-

අනෙකුත් සියළු වියදම් බදු සඳහා ඉඩ දෙනු ලබන බව උපකල්පනය කරන්න.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා පහත සඳහන් දෑ **ගණනය කරන්න.**

(a) හවුල් ව්‍යාපාර ආදායම

(b) හවුල් ව්‍යාපාර ආදායම් මත අඩුකළ යුතු රඳවා ගැනීමේ බද්ද **(ලකුණු 10)**

## *07 වන ප්‍රශ්නය*

**සී/ස සූටින් (පුද්ගලික) සමාගම** දේශිය හා විදේශිය වෙළඳපොල දෙකම සඳහා සෙල්ලම් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ නිරත එකකතු කළ අගයමත බද්ද (VAT) සඳහා ලියාපදිංචි තැනැත්තෙකි. ඊට අමතරව ඔවුන් අන්ධ පුද්ගලයින් සඳහා සුදු සැරයටි නිපදවනු ලබයි. 2019 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා පහත තොරතුරු සමාගමේ පොත්වලින් උපුටා ගන්නා ලදී.

(1) සැපයුම් පිළබඳ විස්තර (VAT රහිතව)

| | රු. |
|---|---|
| සෙල්ලම් බඩු අපනයනය | 1,860,000 |
| සෙල්ලම් බඩු දේශිය විකණුම් | 6,510,000 |
| සුදු සැරයටි විකිණීම-දේශීය | 930,000 |
| | 9,300,000 |

(2) කාර්තුව තුළදී සමාගම පහත යෙදවුම් බදු ගෙවා තිබේ.

| | රු. |
|---|---|
| සෙල්ලම් බඩු සඳහා ඇසුරුම් ද්‍රව්‍ය ආනයනය මත | 245,000 |
| දේශීය මිලට ගැනුම් මත | 184,000 |
| | 429,000 |

(3) ගමන් බිමන් සඳහා භාවිතා කරන මෝටර් රථ අළුත්වැඩියාව සඳහා රු.12,000/- ක යෙදවුම් බද්දක් ගෙවා තිබේ. එය දේශිය මිලට ගැනුම් මත VAT තුළ ඇතුලත් වේ.

(4) පෙර කාර්තුවෙන් ඉදිරියට ගෙන එන ලද අතිරික්ත යෙදවුම් බද්ද රු.104,000/- කි.

(5) සමාගම,මාසික (VAT) වාරික වශයෙන් රු.400,000/- ක් ගෙවා තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2019 සප්තැම්බර් 30 දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ඉතිරි ගෙවිය යුතු/වැඩිපුර ගෙවූ) එකතු කළ අගය මත බද්ද **තක්සේරු කරන්න.** **(ලකුණු 10)**

## *B කොටස අවසානය*

අනිවාර්ය ප්‍රශ්න දෙකකි

(මුළු ලකුණු - 50 )

**C කොටස**

## *08 වන ප්‍රශ්නය*

**සී/ස ඊ එඩියුකෝ (පුද්ගලික) සමාගම** 2017 අප්‍රේල් මාසයේදී , ශ්‍රී ලංකාවේ සංස්ථාපනය කරන ලද සමාගමක් වන අන්තර්ජාලය හරහා අධ්‍යාපන සේවා සැපයීමේ ව්‍යාපාරයක නිරතවී සිටියි. එයට සමාගාමීව මුද්‍රණ ශාඛාව වශයෙන් ක්‍රියාකරන පරිපාලිත සමාගමක් තිබේ.

2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා **සී/ස ඊ එඩියුකෝ (පුදගලික) සමාගමේ** මූල්‍ය ප්‍රකාශනවලින් පහත තොරතුරු උපුටාගෙන තිබේ:

(1) සියළු වියදම් අඩු කිරීමෙන් හා සියළුම ආදායම් බැර කිරීමෙන් පසු 2019 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා බද්දට පෙර ශුද්ධ ලාභය රු.36,326,600/- කි. වර්ෂය සඳහා සමාගමේ මුළු පිරිවැටුප රු.224,800,000/- ක් විය.

(2) වෙනත් ආදායම් විස්තර:

| | Rs. |
|---|---|
| කුලී ආදායම | 300,000 |
| ස්ථාවර තැන්පතුවක් මත පොලි ආදායම (ශුද්ධ) | 222,300 |
| ලැබුණු ලාභාංශ (ශුද්ධ) | 309,600 |
| පරිගණක විකිනීමෙන් ලාභය | 150,000 |
| | **981,900** |

- එහි රථගාලෙන් කොටසක් අසල පිහිටි සමාගමකට කුලියට දී තිබේ. කුලී ආදායම මත රඳවා තබා ගැනීමේ බද්ද බදු ගැනුම්කරු විසින් අඩුකරගෙන දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවා තිබේ.
- ඉහත පොළිය ලැබුනේ බැංකුව විසින් මාසිකව අදාල රඳවා තබා ගැනීමේ බද්ද අඩුකර ගෙනයි.

(3) දේපල පිරියත හා උපකරණ පිරිවැයට:

| වත්කම | 01.04.2018 දිනට ශේෂය | එකතු කිරිම් | ඉවත්කිරිම් | 31.03.2019 දිනට ශේෂය |
|---|---|---|---|---|
| ඉඩම | 12,500,000 | | | 12,500,000 |
| ගොඩනැගිලි | 10,000,000 | - | - | 10,000,000 |
| මෝටර්වාහන | 2,750,000 | 2,300,000 | - | 5,050,000 |
| කාර්යාල උපකරණ | 987,000 | 140,000 | - | 1,127,000 |
| පරිගණක | 2,875,000 | 1,235,000 | 875,000 | 3,235,000 |
| ගෘහභාණ්ඩ | 1,243,000 | - | - | 1,243,000 |
| | **30,355,000** | **3,675,000** | **875,000** | **33,155,000** |

- 2017/18 තක්සේරු වර්ෂයේ දී මිලට ගත් පරිගණක 2019 පෙබරවාරි මසදී රු.425,000/- කට විකුණා තිබේ.
- අධ්‍යයන ද්‍රව්‍ය අධ්‍යයන මධ්‍යස්ථාන වෙත ප්‍රවාහනය කිරීමට භාවිතා කරන මිනි කැබ්ස්වලින් මෝටර් වාහන එකතු කිරීම් සමන්විත වේ.

(4) පරිපාලන වියදම් තුළ පහත දෑ ඇතුලත් වේ.

- වර්ෂය සඳහා ක්ෂය අය කිරීම රු.3,228,000/- කි.
- වර්ෂය සඳහා පාරිතෝෂික වෙන්කිරීම රු.886,000/- කි.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ පවත්නා ගැටළු සම්බන්ධව පර්යේෂණයක් සඳහා සමාගම රු.මිලියන 1 ක් වැය කර තිබේ.
- අධ්‍යාපන විශේෂඥයන්ගේ සමුළුවක් සඳහා සහභාගී වීමට අධ්‍යක්ෂකවරයෙක් එක්සත් රාජධානියට ගොස් තිබේ. එම ගමනේ පිරිවැය රු.650,000/- කි.
- සමාගම රු.1000,000/- ක් වටිනා පොත් කොළඹ විශ්ව විද්‍යාලයට පරිත්‍යාග කොට ඇති අතර අවශ්‍යතා සහිත දරුවන්ට රු.500,000/- ක් වටිනා අධ්‍යාපන ද්‍රව්‍ය පරිත්‍යාග කර තිබේ.
- කොළඹ දිස්ත්‍රික් උසාවියේ පවතින කම්කරු නඩුවක් සඳහා රු.25,000/- ක නීති වියදමක් දරා තිබේ.

(5) බෙදා හැරීමේ වියදම් තුළ පහත දෑ ඇතුළත් වේ:

- දේශකයින්ට හා කාර්යය මණ්ඩලයට ලබා දුන් නව අවුරුදු තිළිණයන්හි පිරිවැය රු.1,250,000/- ක් විය.
- සිසුන්ගෙන් ලැබිය යුතු රු.600,000/- ක මුදලත් සමාගම විසින් ලියා හරින ලදී. සමාගම ඔවුන්ට එරෙහිව කිසිදු අයකර ගැන්මේ ක්‍රියාමාර්ගයක් ගෙන නොමැත.

(6) මූල්‍ය පිරිවැයෙහි පහත දෑ ඇතුලත් වේ.

2018 අප්‍රේල් මස දී මූල්‍ය ආයතනයකින් සමාගම රු.75,000,000/- ක මුදලක් ලබා ගන්නා ලද අතර එම මුදල් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා භාවිතා කරන ලදී. ණය ගිවිසුම අනුව දෙවසරක ණය සහන කාලයක් හිමිවේ. වර්ෂය තුළදී සමාගම මෙම ණය මුදල මත පොලිය වශයෙන් රු.4,500,000/- ක් ගෙවා තිබේ.

(7) පහත දැක්වෙන වෙනත් තොරතුරුද සපයා තිබේ.

- 2019 මාර්තු 31 වන දිනට සමාගමේ නිකුත්කළ කොටස් ප්‍රාග්ධනය සහ මුළු සංචිත පිළිවෙලින් රු.13,000,000/-ක් සහ රු.2,000,000/- ක් විය.
- 2018/19 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවීම් රු.1,124,000/- කි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂ සඳහා **සී /ස ඊ එඩියුකෝ (පුද්ගලික) සමාගම** විසින් ගෙවිය යුතු (වැඩිපුර) ගෙවූ ආදායම් බද්ද **තක්සේරු කරන්න.**

**(ලකුණු 25)**

## *09 වන ප්‍රශ්නය*

60 හැවිරිදි **මෙන්ඩිස් මහතා** 2018 ජනවාරි මාසයේදී රජයේ සේවයෙන් විශ්‍රාම ලැබීය. 2018 මැයි 01 වන දින සිට ඔහු ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ සමාගමක කළමනාකරුවෙකු වශයෙන් බැඳුනි. ඔහු ඔහුගේ ප්‍රාථමික සේවා නියුක්ති ප්‍රකාශය සමාගමට ලබා දී තිබේ. පහත තොරතුරු 2018/19 තක්සේරු වර්ෂය *(මින්පසු වර්ෂය වශයෙන් හැඳින්වෙන)* ඔහුගේ ආදායම සම්බන්ධව වේ:

(1) වර්ෂය සඳහා ලැබුණු රජයේ විශ්‍රාම වැටුප රු.1,200,000/-.

(2) වර්ෂය තුළදී ඔහුට පහත දෑ සමාගමෙන් ලැබී තිබේ:

- දළ වැටුප මාසයකට රු.180,000/- බැගින්.
- ගමන් බිමන් දීමනාව මාසයකට රු.40,000/- බැගින්.
- 2018 දෙසැම්බර් මාසයේදී ලැබුණු ප්‍රසාද දීමනාව රු.90,000/-.
- ඔහු සේවා යෝජකයා විසින් සපයන ලද කුළී රහිත නිවසක ජීවත් වෙයි. සමාගම මාසයකට රු.30,000/- බැගින් හිමිකරුට ගෙවයි.
- වර්ෂය තුළදී සමාගම රු43,000ක ඔහුගේ දුරකතන බිල් ප්‍රතිපූර්ණය කරන ලදි.

(3) **මෙන්ඩිස් මහතාට** කුරුණෑගල පොල් වත්තක් තිබේ. ඉහත කත්සේරු වර්ෂය සඳහා වත්තේ ආදායම් සහ වියදම් පහත දැක්වේ:

| | | | |
|---|---|---|---|
| වැටුප් | 1,675,000 | පොල් විකිණීම | 2,850,000 |
| පොහොර | 876,000 | වෙනත් කෘෂි භෝග විකිණීම | 253,000 |
| වල්පැල ගලවන යන්ත්‍රවල පිරිවැය | 20,000 | | |
| අනුමත පුණ්‍යායතනයකට පරිත්‍යාග | 100,000 | | |
| විදුලිය හා ජල බිල්පත් | 64,000 | | |
| වෙනත් වියදම් | 127,000 | | |
| ශුද්ධ ලාභය | 241,000 | | |
| | **3,103,000** | | **3,103,000** |

(4) **මෙන්ඩිස් මහතාට** පානදුර ප්‍රදේශයේ වානිජ ගොඩනැගිල්ලක් තිබේ. එය කිහිප දෙනෙකුට කුළියට දී තිබේ. ලැබුණු මුළු කුළී ආදායම රු.2,000,000/- කි. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා ගෙවන ලද වරිපනම් රු.2,50,000/- කි. කුළී ආදායම මත රඳවාගැනීමේ බදු අඩුකර තිබේ. ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වාණිජ බැංකුවකින් ලබා ගත් ණය මුදල සඳහා ගෙවන ලද පොලිය රු.430,000/- කි.

(5) ඔහු ලැයිස්තුගත පොදු සමාගම් කිහිපයක ආයෝජනය කර ඇති අතරවර්ෂය තුළදී ඔහුට ශුද්ධ ලාභාංශ වශයෙන් රු.236,500/- ක් ලැබී තිබේ.

(6) වර්ෂය තුළදී **මෙන්ඩිස් මහතාට** පහත පොලී ආදායම් ලැබී තිබේ.

- රාජ්‍ය බැංකුවක ඇති ඉතිරිකිරීමේ ගිණුමකින් රු.36,000/- රඳවා ගැනීමේ බදු අඩු කර නොමැත.
- මිතුරෙකුට ලබා දුන් ණය මුදලක් සඳහා රු.50,000/- කි.

(7) 2010 දී රු.මිලියන 10 ක පිරිවැයකට ඉඩමක් කළුතර තිබේ. 2017.09.30 දිනට වෙළඳපල වටිනාකම රු. මිලියන 13 කි. ඔහු මෙම ඉඩම 2019 මාර්තු මාසයේදී රු.මිලියන 15 කට විකුණන ලද අතර පහත වියදම් දරණ ලදී.

- තැරැව්කාර ගාස්තු -රු.750,000/-
- ප්‍රචාරණ දැන්වීම් -රු.100,000/-

(8) සේවා යෝජක විසින් අඩුකරන ලද උපයන විට ගෙවීමේ බදු (paye) රු.127,380/- කි.

**ඔබ විසින් කළයුතු දෑ:**

2018/19 තක්සේරු වර්ෂය සඳහා **මෙන්ඩිස් මහතාගේ** ආදායම් බදු වගකීම සහ ඉතිරි ගෙවිය යුතු (වැඩිපුර ගෙවූ ) බද්ද **තක්සෙරු කරන්න.**

*(යම් ආදායමක් බද්දට යටත් නොවේ නම් බව පැහැදිලි ව සඳහන් කළ යුතුය.)*

**(ලකුණු 25)**

**C කොටසේ අවසානය**

# කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| **විශ්ලේෂණය (4)** | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න |
| | | වෙනස් කොට දක්වන්න | යමක් තවෙකකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම |
| | | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම |
| **භාවිතය (3)** | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිතකර ගැළපීම | භාවිත කරන්න | ප්‍රායෝගිකව භාවිතයේ යෙදෙන්න |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම |
| | | පිළියෙළ කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම |
| | | විසඳන්න | ගණනය කිරීම හා හෝ පැහැදිලි කිරීම හරහා විසඳුම් සෙවීම |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මකබව තීරණය කරන්න |
| | | ප්‍රස්ථාර දක්වන්න | ප්‍රස්ථාර මගින් නියෝජනය කරන්න |
| | | සසඳන්න | තවත් එකක් සමග අනුගත/අනුරූප කරන්න |
| **අවබෝධය (2)** | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න |
| | | අර්ථකථනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න |
| | | හඳුනා ගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම |
| **දැනුම (1)** | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම |
| | | අඳින්න | හැඩයක් හෝ රූප සටහනක් ගෙනහැර දැක්වීම |

ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

2020 විෂය නිර්දේශය

ආදර්ශ විසඳුම්

# අදියර III

# 304 - සංස්ථාපිත සහ පුද්ගලික බදුකරණය [CPT]

අධ්‍යාපන සහ පුහුණුකිරීම් අංශයේ ප්‍රකාශනයකි.

අනිවාර්ය ප්‍රශ්න හතර (4 )කි

මුළු ලකුණු 20

**A කොටස**

## 01 වන ප්‍රශ්නය සඳහා පිළිතුර

**ඒකකය 01 ශ්‍රී ලංකාවේ බදු කරණය පිළිබඳ හැඳින්වීම**

ඉගෙනුම් ප්‍රතිඵල - බදු සම්බන්ධව වාසික නීතිය භාවිතා කිරීම.

යම් සමාගමක්,

- ශ්‍රී ලංකාවේ නීතිය යටතේ සංස්ථාගතකර හෝ පිහිටුවා ඇත්නම්
- ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇත්ම් හෝ
- තක්සේරු වර්ෂයේ යම් අවස්ථාවකදී එම සමාගමේ කටයුතු කලමණාකරණය හා පාලනය ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කර ඇත්නම්

එම සමාගම ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ. **සී/ස ග්ලෝබල් ටෙකස් ශ්‍රී ලංකා (පුදගලික) සමාගම** ශ්‍රී ලංකාවේ සමාගම් පනත යටතේ සංස්ථාගතකර ඇති බැවින් ශ්‍රී ලංකාවේ වාසිකයෙකු වේ. **(ලකුණු 05)**

## *02 වන ප්‍රශ්නය සඳහා පිළිතුර*

**03 ඒකකය - පුද්ගලික සහ සමාගම් බදුකරණය**

ඉගෙනුම් ප්‍රතිඵල - අතේ දුරින් වූ මිල සංකල්පය සහ පැවරුම් මිලට අදාල ලියවිලි පැහැදිලි කිරීම

**(a)**

(1) අනෙක් ව්‍යවසායේ බහුතර ඡන්දය පාවිච්චි කිරීමේ බලය හෝ කොටස් යම් පුද්ගලයෙක් හෝ ව්‍යවසායක් විසින් ඍජුව හෝ වක්‍රව දැරීම.

(2) එවැනි එක් එක් ව්‍යවසායන්ගේ 50% නොඅඩු ඡන්දය පාවිච්චි කිරීමේ බලය සහිත කොටස් යම් පුද්ගලයෙක් හෝ ව්‍යවසායක් විසින් ඍජුව හෝ වක්‍රව දැරීම.

(3) ආශ්‍රිත වයවසායක් ලෙස නොසැලකෙන බැංකුවක් විසින් දී නොමැති එක් ව්‍යවසායක් විසින් අනෙක් ව්‍යවසාය ලබා දී ඇති ණය ප්‍රමාණය එකී ණය ලබා ගත් ව්‍යවසායේ මුළු වත්කම්වල පොත් වටිනාකමෙන් 51%කට නො අඩුවීම.

(4) ආශ්‍රිත ව්‍යවසායක් ලෙස නොසැලකෙන බැංකුවක් විසින් දී නොමැති එක් ව්‍යවසායක් විසින් අනෙක් ව්‍යවසායට ලබා දී ඇති ණය සහ ස්කන්ධ ප්‍රමාණය එකී ණය ලබාගත් ව්‍යවසායේ මුළුවත්කම්වල පොත් වටිනාකමෙන් 51% කට නොඅඩු වීම.

(5) එක් ව්‍යවසායක සමස්ත ණය ගැණීම්වලින් 25% කට නොඅඩු ප්‍රමාණයකට අනෙක් ව්‍යවසාය ඇප සහතික වීම.

(6) එක් ව්‍යවසායක අධ්‍යක්ෂකවරුන්ගෙන් හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් අඩකට වැඩි සංඛ්‍යාවක් හෝ විධායක අධ්‍යක්ෂකවරුන් හෝ පාලන මණ්ඩලයේ විධායක සාමාජිකයින් එක් අයෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අනෙක් ව්‍යවසාය විසින් පත්කිරීම.

(7) ව්‍යවසායන් දෙකෙහි අධ්‍යක්ෂ මණ්ඩල හෝ පාලක මණ්ඩලයේ සාමාජිකයින්ගෙන් අඩකට වැඩි සංඛ්‍යාවක් හෝ විධායක අධ්‍යක්ෂකවරුන් හෝ පාලක මණ්ඩල විධායක සාමාජිකයින් එක් අයෙකු හෝ වැඩි ගණනක් එකම තැනැත්තෙකු හෝ තැනැත්තන් විසින් පත් කිරීම.

(8) විකිනීම සඳහා මිලදී ගැනීම හෝ එක් ව්‍යවසායක් විසින් යම් භාණ්ඩ හෝ ද්‍රව්‍ය නිෂ්පාදනය හෝ සකස් කිරීම සඳහා අවශ්‍යවන අමුද්‍රව්‍ය අර්ධ නිමිභාණ්ඩ හෝ පරිභෝජන භාණ්ඩවලින් 90% කට වඩා වැඩි ප්‍රමාණයක් අනෙක් ව්‍යවසාය විසින් හෝ අනෙක් ව්‍යවසාය විසින් නම් කරනු ලැබූ තැනැත්තන් විසින් සපයන අවස්ථාවක සහ සැපයුම්වල මිල සහ සැපයීමට අදාල අනෙකුත් කොන්දේසි සඳහා අනෙකුත් ව්‍යවසාය විසින් බලපෑමක් කරන අවස්ථාවක.

(9) එක් ව්‍යසවසායක් විසින් නිෂ්පාදනය හෝ සකස් කරන භාණ්ඩ හෝ ද්‍රව්‍ය වෙනත් ව්‍යවසායකට හෝ ව්‍යවසාය විසින් විශේෂයෙන් දක්වා ඇති පුදගලයින්ට විකිණීම / පැවරීම සහ එවැනි ව්‍යවසායක් විසින් මිල හෝ එයට සම්භන්ධ අනෙකුත් කොන්දේසි සඳහා බලපෑම් කිරීම හෝ මෙහි ප්‍රතිලෝමය වන අවස්ථාවේදී.

(10) එක් ව්‍යසවසායක් තනි පුද්ගලයෙක් විසින් හෝ එවැනි පුද්ගලයෙකු සහ ඔවුන්ගේ සම්බන්ධිත තැනැත්තන් විසින් සාමූහිකවද අනෙක් ව්‍යාපාරය එවැනි තනි පුද්ගලයෙකු හෝ ඔහුගේ සම්බන්ධිත තැනැත්තන් විසින් හෝ එවැනි පුද්ගලයෙකු සහ ඔහුගේ සම්බන්ධිත පුදගලයන් විසින් සාමූහිකව හෝ එවැන් තනි පුද්ගලයෙකුගේ සම්බන්ධිත පුද්ගලයන් විසින් සාමූහිකව පාලනය කරනු ලබන අවස්ථාවක.

(11) එක් ව්‍යසායක් ව්‍යාපාර ආයතනයක් පුද්ගල සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් වන අවස්ථාවක අනෙකුත් ව්‍යවසාය විසින් එකී ව්‍යාපාර ආයතනයේ පුද්ගල සංගමයේ හෝ පුද්ගල මණ්ඩලයේ 10% කට නොඅඩු කොටසක් හිමිකම් දැරීම.

(12) යම් ආයතනයක් විසින් පාලන ගණුදෙනුවක් සිදුකර ඇති විටකදී සහ පනතේ 76 සහ 77 වගන්ති ප්‍රකාර කලමනාකරණ පාලන හෝ ප්‍රාග්ධනයට ඍජුව සහභාගී නොවී ඇති නිදහස් ආයතනයක් සිදුකළ හැකි හෝ පැනවිය හැකි ගණුදෙනු සමඟ එය වෙනස් වන අවස්ථාවකදී නමුත් යම් වෙනත් යම් නිදහස් පුද්ගලයෙක්ගෙන් නොලැබෙන එවැනි විභව්‍ය වාසියක් එම ආයකනයට ලබා දේනම්.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

**(b)**

(1) සංසන්දනය කළ හැකි පාලනයකින් තොර මිල ක්‍රමය.

(2) ප්‍රති අලෙවි මිල ක්‍රමය.

(3) පිරිවැය එකතු කළ මිල ක්‍රමය.

(4) ගනුදෙනු මත ශුද්ධ ආන්තික ලාභ ක්‍රමය.

(5) ලාභ ජේදන ක්‍රමය.

**(ඕනෑම කරුණු 02 කට ලකුණු 02)**

**(c)**

(1) දේශීය ගොනුව.

(2) ප්‍රධාන ගොනුව.

(3) රටින් රට වාර්තාව. **(ඕනෑම කරුණු 01 කට ලකුණු 01)**

**(මුළු ලකුණු 05)**

***03 වන ප්‍රශ්නය සඳහා පිළිතුර***

**06 වන ඒකකය - රඳවා ගැනීමේ බදු, ප්‍රාග්ධන ලාභ සහ නඩු තීන්දු නීති**

ඉගෙනුම් ප්‍රතිඵල - අදාල වන රඳවා ගැනීමේ බදු සහ අවසානාත්මක බදු තක්සේරු කිරීම.

| ගෙවීම | රඳවා ගැනීමේ අදාලත්වය | අනුපාතය | රඳවා ගැනීමේ බද්ද |
|---|---|---|---|
| කාර්යාල පරිශ්‍රය සඳහා රු.40,000/-ක කුලී ගෙවීම | අදාල වේ | 10% | 4,000 |
| ව්‍යාපාර ලාභ වලින් ගෙවූ රු.1,200,000/- ක අතුරු ලාභාංශ | අදාල වේ | 14% | 168,000 |
| සමාගමේ වාහන අළුත් වැඩියා කළ කාර්මිකයෙකුට රු.100,000/- ක් ගෙවීම | අදාල වේ | 5% | 5,000 |
| බැංකුවකින් ලබාගත් වාහන මූල්‍ය කල්බද්දක් සඳහා රු.53,650/- ක පොලි ගෙවීම | නැත.මූල්‍ය ආයතනයකට ගෙවන ලද නිසා | - | - |
| කම්කරු නඩුවක් සඳහා සපයන ලද සේවා වෙනුවෙන් නීතීඥවරයෙකුට රු30,000/- ක් ගෙවීම | නැත. රු.50,000/-ට වඩා අඩු අගයකි | - | - |

**(ලකුණු 05)**

**04 වන ප්‍රශ්නය සඳහා පිළිතුරු**

**04 වන ඒකකය - වෙනත් ව්‍යාපාර බදු**

ඉගෙනුම් ප්‍රතිඵල - එකතුකළ අගය මත බද්ද (VAT) ට අදාලව පැනවීම ලියාපදිංචිය ගණනය කිරීම සහ විවිධ වගකීම් විස්තර කිරීම.

**(a)** පහත සිදුවීම් අතරින් පළමු සිදුවන සිද්ධිය සිදුවූ අවස්ථාව සැපයීමේ වේලාව වේ.

(1) සැපයුම්කරු විසින් භාණ්ඩ සඳහා ඉන්වොයිසියක් නිකුත් කල දිනය හෝ

(2) භාණ්ඩ සඳහා අත්තිකාරමක් ඇතුළුව ගෙවීමක් ලැබීම හෝ

(3) ඒ භාණ්ඩ සැපයුම වෙනුවෙන් ගෙවීමක් ලැබිය යුතු වීම.

(4) භාණ්ඩ භාර දීම සිදුකිරිම. **(ලකුණු 03)**

**(b)**

(1) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන නිර්වාසික පුද්ගලයෙක් විය යුතුය.

(2) ශ්‍රී ලංකා ආගමන විගමන පාලක ජනරාල් වරයා විසින් නිකුත් කළ සංචාරක වීසා මත පැමිණ ආපසු ගෙවීම් ඉල්ලුම්කරන දිනට දින 90 ක් හෝ ඊට අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ රැඳී සිටිය යුතුය.

(3) ශ්‍රී ලංකාවට පැමිණි දිනයට වයස අවුරුදු 18ක් විය යුතුය.

**(ලකුණු 02)**

*05 වන ප්‍රශ්නය සඳහා පිළිතුර*

| |
|---|
| 05 වන ඒකකය - **බැඳීම් සහ ක්‍රියා පටිපාටි** |
| **ඉගෙනුම් ප්‍රතිඵල - ස්වතක්සේරු ක්‍රමය සහ ආදායම් බදු ගෙවීම් කිරීමට නියමිත දිනයකන් හඳුනා ගැනීම** |

**(a)** 2017 අංක 24,දරන දේශිය ආදායම් පනතේ 90,91,92 වගන්ති අනුව ආදායම් බදු ගෙවීමට යටත්වන සෑම තැනැත්තෙකුම ඇස්තමේන්තුගත බද්ද වාරික හතරකින් ගෙවිය යුතුය.

2018/19 තක්සේරු වර්ෂය සඳහා කාර්තුමය වාරික ගෙවීමට නියමිත දින වන්නේ:

පලමු කාර්තුව-2018 අගෝස්තු 15 වන දින හෝ ඊට පෙර.

දෙවන කාර්තුව-2018 නොවැම්බර් 15 වන දින හෝ ඊට පෙර.

තෙවන කාර්තුව-2019 පෙබරවාරි 15 වන දින හෝ ඊට පෙර.

සිව්වන කාර්තුව-2019 මැයි 15 වන දින හෝ ඊට පෙර.

අවසාන ගෙවීම-2019 සැප්තැම්බර් 30 වන දින හෝ ඊට පෙර. **(ලකුණු 03)**

**(b)** ඇස්තමේන්තුගත ගෙවිය යුතු බද්ද පහත දෙයාකාරයට ගණනය කල හැක:

(i) වර්තමාන වර්ෂයේ ලාභ පදනම්කර ගනිමින් ඇස්තමේන්තුගත ආදායම් බද්ද.

(ii) පසුගිය වර්ෂයේ බදු වගකීම 5% කින් වැඩිකළ අගය පදනම්කරගත් ඇස්තමේන්තුගත ගෙවිය යුතු ආදායම් බද්ද.

*(මෙම පදනම් 2018/19 තක්සේරු වර්ෂය තෙක් සඳහා පමණක් අදාල වේ)*

වාරික ගෙවීම = <u>ඇස්තමේන්තුගත බද්ද - [වාරික ගෙවීම් + රඳවා ගැනීමේ බදු]</u>

ඉතිරි වාරික ගණන **(ලකුණු 04)**

**(c)** (1) 179 (2) වගන්තිය අනුව බද්ද නියමිත දින සිට දින 14 ක් තුළ නොගෙව්වේ නම් ගෙවිය යුත බද්දේන් 10% කට සමාන ප්‍රමාණාධිත දණ්ඩනයක් පැනවිය හැකිය.

(2) බද්දක් නියමිත දිනට ගෙවා නොමැති නම් බදු ගෙවිය යුතු දිනය සහ ගෙවන ලද දිනය අතර කාලපරිච්ඡේදය සඳහා *(කාලය දීර්ඝ කිරීම නොසලකා)* මාසිකව ගණනය කරනු ලබන මසකට හෝ මසකින් කොටසකට 1.5 %ක පොලියක් ගෙවීමට බදු ගෙවන්නා බැඳී සිටියි. **(ලකුණු 03)**

**(මුළු ලකුණු 10)**

*06 වන ප්‍රශ්නයට සඳහා පිළිතුර*

| |
|---|
| **06 වන ඒකක** - විවිධ ව්‍යවසායන්හි බදුකරණය<br><br>ඉගෙනුම් **ප්‍රතිඵල** - හවුල් ව්‍යාපාරයක රඳවා ගැනීමේ බද්ද ගණනය කිරීම.<br><br>හවුල්කරුවන්ගේ බදු වගකීම තක්සේරු කිරීම |

**(a)**

**2018/19 තක්සේරු වර්ෂය**

| | | |
|---|---|---|
| බද්දට පෙර ලාභය | | 3,080,200 |
| අඩුකළා - ආයෝජන ආදායම | | |
| පොලී ආදායම | | (219,700) |
| ලාභාංශ ආදායම | | (64,500) |
| | | |
| එකතුකලා: | | |
| හවුල්කරුවන්ගේ වැටුප් | | 1,800,000 |
| ප්‍රාග්ධනය මත පොලිය | | 111,000 |
| **හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම** | | 4,707,700 |
| | | |
| **හවුල් ව්‍යාපාරයේ ව්‍යාපාර ආදායම** | | 4,707,700 |
| පොලිය | 219,700 | |
| ලාභාංශ අවසානාත්මක රඳවා ගැනීමේ බදු | - | |
| **හවුල් ව්‍යාපාරයේ ආයෝජන ආදායම** | | 219,700 |
| **මුළු හවුල් ව්‍යාපාර ආදායම** | | 4,926,700 |

**(ලකුණු 08)**

**(b)**

| | | |
|---|---|---|
| රඳවා ගැනීමේ බද්දට යටත් හවුල් ව්‍යාපාර ආදායම | | 4,926,700 |
| **8% බැගින් රඳවා ගැනීමේ බද්ද** | | 394,136 |

**(ලකුණු 02)**

**(මුළු ලකුණු 10)**

*07 වන ප්‍රශ්නයට සඳහා පිළිතුර*

**07 වන ඒකකය - වෙනත් ව්‍යාපාර බදු**

**ඉගෙනුම් ප්‍රතිඵල -** එකතුකල අගය මත බද්ද පැනවීම,ව ලියාපදිංචිය, ගණනය කිරීම සහ විවිධ බැදීම් විස්තර කිරීම.

**2019 සැප්තැම්බර් 30 වන දිනෙන් අවසන් වූ කාර්තුව සඳහා ගෙවිය යුතු එකතු කල අගය මත බද්ද**

| | | | | | |
|---|---|---|---|---|---|
| **නිමැවුම් බද්ද** | | | | | |
| බද්දට යටත් සැපයුම් | 6,510,000 | 15% | | 976,500 | |
| නිදහස් සැපයුම් | 930,000 | නිදහස් | | - | |
| ශූන්‍ය අනුපාත සැපයුම් | 1,860,000 | 0% | | - | |
| | **9,300,000** | | | | **976,500** |
| **යෙදවුම් බද්ද** | | | | | |
| අමුද්‍රව්‍ය ආනයන | | | | 245,000 | |
| දේශිය මිලට ගැනුම් | | | 184,000 | | |
| මෝටර් රථය අළුත් වැඩියාව මත | | | (12,000) | | |
| | | | 172,000 | | |
| නිදහස් සැපයුම්වල ආරෝපණය කළ හැකි යෙදවුම් බද්ද | | | (17,200) | | |
| | | | | 154,800 | |
| ඉඩදෙන යෙදවුම් බද්ද | | | | 399,800 | |
| ඉදිරියට ගෙන ආ යෙදවුම් බද්ද | | | | 104,000 | |
| | | | | 503,800 | |
| ශූන්‍ය අනුපාත සැපයුම්වලට ආරෝපණය කල යෙදවුම් බද්ද | | | | 79,960 | |
| ඉතිරි යෙදවුම් බද්ද, නිමැවුම් බද්දෙන් (976500) 100% කට සීමාවන | | | 976,500 | 423,840 | |
| | | | | | 503,800 |
| ගෙවිය යුතු බද්ද | | | | | 472,700 |
| අඩුකලා: ගෙවූ වාරික | | | | | (400,000) |
| **ඉතිරි ගෙවිය යුතු බද්ද** | | | | | **72,700** |

**(මුළු ලකුණු 10)**

*08 වන ප්‍රශ්නය සඳහා පිළිතුර*

**ඒකක 02, 03 සහ 05 - ආදායම් ප්‍රභව**
**තනි පුද්ගල හා සමාගම් බදුකරණය**
**රඳවා ගැනීමේ බදු ,ප්‍රාග්ධන ලාභ බද්ද සහ නඩු තීන්දු නීතිය**

**ඉගෙනුම් ප්‍රතිඵල** - ආදායම් ප්‍රභව තක්සේරු කිරීම්
තනි පුද්ගලයන්ගේ සහ සමාගම්වල දළ ආදායම් බදු වගකීම තක්සේරු කිරීම.

**සීමාසහිත ඊ එඩියුකෝ පුද්ගලික සමාගම**

**2018/2019 තක්සේරු වර්ෂය**

| | | රු. |
|---|---|---|
| ව්‍යාපාර ආදායම (සටහන 01) | | 41,414,850 |
| ආයෝජන ආදායම (සටහන 02) | | 234,000 |
| **තක්සේරු කළ හැකි ආදායම** | | **41,648,850** |
| අඩු කළා: සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන | | |
| විශ්ව විද්‍යාලයට කළ පරිත්‍යාග | | 1,000,000 |
| අධ්‍යයන ද්‍රව්‍ය පරිත්‍යාග, ඉඩ නොදේ | | - |
| **බදු අයකළ හැකි ආදායම** | | **40,648,850** |
| **බදු වගකීම** | | |
| **අධ්‍යාපන සේවා ආදායම මුළු ආදායමෙන් 80% නිසා 14 % බැගින් බදු වගකීම** | | **5,690,839** |
| බදු බැර | | |
| ආර්ථික සේවා ගාස්තු | | (1,124,000) |
| කුලී මත රඳවා ගැනීමේ බද්ද | | (30,000) |
| පොලිය මත රඳවා ගැනීමේ බද්ද | | (11,700) |
| **ඉතිරි ගෙවිය යුතු බද්ද** | | **4,525,139** |

**<u>සටහන 01 - ව්‍යාපාර ආදායම ගණනය කිරීම</u>**

| | | | | | |
|---|---|---|---|---|---|
| බද්දට පෙර ලාභය | | | | | 36,326,600 |
| අඩු කළා ආයෝජන ආදායම | | | | | |
| කුලී ආදායම | | ව්‍යාපාර ආදායමකි | | | - |
| ලාභාංශ ආදායම | | | | | (309,600) |
| පොලී ආදායම | | | | | (222,300) |
| අඩු කළා - බද්දට යටත් නොවන ආදායම් | | | | | |
| පරිගණක විකිනීමෙන් ලාභය | | | | | (150,000) |
| අඩුකලා -පරිගණක විකිණීම මත තුලනය කිරීමේ දීමනාව | | | | | |
| | විකුණුම් මිල | | 425,000 | | |
| | බදුසඳහා ලියා හළ අගය | | (656,250) | | (231,250) |
| ක්ෂය | | | | | 3,228,000 |
| පාරිතෝෂික වෙන්කිරීම | | | | | 886,000 |
| පර්යේෂණ වියදම -ආදායම් ජනනය කිරීම සඳහා දරා නොමැත | | | | | 1,000,000 |
| විදේශ ගමන් වියදම් -ඉඩදේ | | | | | - |
| විශ්ව විද්‍යාලයට කළ පරිත්‍යාග | | | | | 1,000,000 |
| ශිෂ්‍යයන්ට කළ පරිත්‍යාග | | | | | 500,000 |
| නීති ගාස්තු-ඉඩ දේ | | | | | - |
| නව වසර සඳහා ත්‍යාග- | | disallowed | | | 1,250,000 |
| ලියා හැරීම | | disallowed | | | 600,000 |
| මූල්‍ය පිරිවැය | | | 4,500,000 | | |
| (කොටස් ප්‍රාග්ධනය+ සංචිත)×4 | 60,000,000 | | | | |
| ඉඩ දෙන පොලිය | 4,500,000/75,000,000 x 60,000,000 | | 3,600,000 | | |
| ඉඩ නොදෙන මූල්‍ය පිරිවැය | | | | | 900,000 |
| <u>අඩු කළා ප්‍රාග්ධන දීමනා</u> | | | | | |
| ඉඩම | 12,500,000 | 2017/18 | ප්‍රාග්ධන දීමනා නැත | | |
| ගොඩනැගිලි | 10,000,000 | 2017/18 | 10% | | (1,000,000) |
| මෝටර් වාහන | 2,750,000 | 2017/18 | 20% | | (550,000) |
| මෝටර් වාහන | 2,300,000 | 2018/19 | අවු 5 | | (460,000) |
| කාර්යාල උපකරණ | 987,000 | 2017/18 | 33% | | (329,000) |
| කාර්යාල උපකරණ | 140,000 | 2018/19 | අවු 5 | | (28,000) |
| පරිගනක | 2000000 | 2017/18 | 25% | | (500,000) |
| පරිගනක | 1,235,000 | 2018/19 | 20% | | (247,000) |
| ගෘහභාණ්ඩ | 1,243,000 | 2017/18 | 20% | | (248,600) |
| **ව්‍යාපාර ආදායම** | | | | | **41,414,850** |

| **සටහන 02 - ආයෝජන ආදායම ගණනය කිරීම** | | |
|---|---|---|
| පොලී ආදායම | | 234,000 |
| ලාභාංශ ආදායම | අවසාන බදු | - |
| **ආයෝජන ආදායම** | | 234,000 |

**(මුළු ලකුණු 25)**

*09 වන ප්‍රශ්නය සඳහා යෝජිත පිළිතුර*

**2, 3, 5 ඒකක - ආදායම් ප්‍රභව**

**තනි පුද්ගල සහ සමාගම් බදුකරණය**

**රඳවා ගැනීමේ බදු, ප්‍රාග්ධන ලාභ බද්ද සහ නඩු තීන්දු නීතිය**

**ඉගෙනුම් ප්‍රතිඵල** - ආදායම් ප්‍රභව තක්සේරු කිරීම

තනි පුද්ගලයන්ගේ සහ සමාගම්වල දළ බදු වගකීම තක්සේරු කිරීම.

වත්කම් සහ වගකීම් උපලබ්ධි වීම මගින් ඇතිවන ලාභ සහ අලාභ මත බද්ද තක්සේරු කිරීම.

**මෙන්ඩිස් මහතා**

**2018/19 තක්සේරු වර්ෂය**

**ආදායම් බද්ද ගණනය කිරීම**

| | | | | | |
|---|---|---|---|---|---|
| **සේවා නියුක්තිය** | | | | | |
| රජයෙන් ලැබුණු විශ්‍රාම වැටුප -නිදහස් | | | | | |
| ප්‍රාථමික සේවා නියුක්තිය | | | | | |
| වැටුප | | | | 1,980,000 | |
| ගමන් වියදම් දීමනාව | | | | 440,000 | |
| ප්‍රසාද දීමනා | | | | 90,000 | |
| වාසස්ථානය | වෙළඳ පොල වටිනාකම නිශ්චය කළ හැක | | | 330,000 | |
| දුරකතන බිල්පත් | 50% | | | 21,500 | |
| **සේවා නියුක්තික ආදායම** | | | | | **2,861,500** |
| **ව්‍යාපාරය** | | | | | |
| ශුද්ධ ලාභය | | | | 241,000 | |
| එකතු කළා පරිත්‍යාග | | | | 100,000 | |
| යන්ත්‍ර පිරිවැය | | | | 20,000 | |
| අඩුකලා ප්‍රාග්ධන දීමනා | | 20,000 | අවු.5 | (4,000) | |
| **ව්‍යාපාර ආදායම** | | | | | **357,000** |
| **ආයෝජන** | | | | | |
| ලාභාංශ ආදායම- | | | | | |
| ලාභාංශ -ලැයිස්තුගත සමාගම්වලින් රඳවා ගැනීමේ බදු අඩුකර ලැබීමයි. | | | | අවසාන බදු | |

| | | | | | |
|---|---|---|---|---|---|
| **<u>පොලී ආදායම</u>** | | | | | |
| ඉතුරුම් ගිණුම් මත | | | | 36,000 | |
| ණය මත | | | | 50,000 | 86,000 |
| **<u>කුලී ආදායම</u>** | | | | | |
| දළ කුලිය | | | | 2,000,000 | |
| අඩුකළා වරිපනම් | | | | (250,000) | |
| පොලිය | | | | (430,000) | |
| | | | | | 1,320,000 |
| <u>ආයෝජන වත්කම් උපලබ්ධි වීම</u> | | | | | |
| ප්‍රතිෂ්ඨාව | | | | 15,000,000 | |
| අඩුකළා සලකනු ලබන පිරිවැය | | | | (13,000,000) | |
| තැරැව් ගාස්තු | | | | (750,000) | |
| දැන්වීම් | | | | (100,000) | 1,150,000 |
| **ආයෝජන ආදායම** | | | | | **2,556,000** |
| **තක්සේරු කළ හැකි ආදායම** | | | | | **5,774,500** |
| අඩුකළ සුදුසුකම් ලබන දීමනා සහ සහන | | | | | |
| පුද්ගල දීමනාව | | | | (500,000) | |
| සේවා නියුක්තික දීමනාව | | | | (700,000) | |
| දළ කුලියෙන් 25% | | | | (500,000) | |
| පොලී ආදායම සඳහා දීමනාව-ජ්‍යෙෂ්ඨ පුරවැසි | | | | (36,000) | |
| අනුමත පුණ්‍යායතනයකට පරිත්‍යාග | | | 100,000 | | |
| | අඩු කළ හැකි අගය | | | (75,000) | |
| | | | | | (1,811,000) |
| බදු අයකළ හැකි ආදායම | | | | | **3,963,500** |
| **බදු වගකීම** | | | | | |
| ප්‍රාග්ධන ලාභය 1,150,000 | | 10% | | 115,000 | |
| 600,000 | | 4% | | 24,000 | |
| 600,000 | | 8% | | 48,000 | |
| 600,000 | | 12% | | 72,000 | |
| 600,000 | | 16% | | 96,000 | |
| 413,500 | | 20% | | 82,700 | |
| | | | | 322,700 | |
| අඩුකළා: බදු බර | | | | | |
| කුලී මත රඳවා ගැනීමේ බද්ද 10% බැගින් | | | | (200,000) | |
| උපයන විට ගෙවීමේ බදු | | | | (127,380) | |
| **වැඩිපුර ගෙවූ බද්ද** | | | | **(4,680)** | |

*(මුළු ලකුණු 25)*